# රුහුණ විශ්වවිද්‍යාලය - දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන ඒකකය
# ශාස්ත්‍රවේදී සාමාන්‍ය (බාහිර) උපාධි ද්විතීය භාග - 2014 පරීක්ෂණය පුනර් සිසුන් සඳහා අයදුම්පත් කැඳවීම

1. රුහුණ විශ්වවිද්‍යාලයේ දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන ඒකකය මගින් ඉහත සඳහන් පරීක්ෂණ සඳහා සුදුසුකම් ලත් අපේක්ෂක අපේක්ෂිකාවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

2. ලියාපදිංචි කාලසීමාව අවසන් වී ඇති, මෙතෙක් ලියාපදිංචිය දීර්ඝ කරවා නොගත් අපේක්ෂක අපේක්ෂිකාවන් (2004,2005,2006,2007,2008,2009,2010 වර්ෂවල ලියාපදිංචි වී ඇති සිසුන්) විභාගය අයදුම් කිරීමට පෙර තම ලියාපදිංචි කාල සීමාව දීර්ඝ කර ගත යුතු අතර, ඒ සඳහා නියමිත අයදුම්පත් විශ්වවිද්‍යාලයේ දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන ඒකකය මගින් ලබා ගත හැකි ය. **ලියාපදිංචිය දීර්ඝ කරගන්නා තෙක් එම අපේක්ෂක අපේක්ෂිකාවන් වෙත විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු නො ලැබේ.**

3. **අයදුම්පත් භාරගන්නා අවසාන දිනය 2016.11.30** දින බැවින්, නිසි පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍ර එදින හෝ ඊට පෙර ලැබෙන සේ "සහකාර ලේඛකාධිකාරී, දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන ඒකකය, රුහුණ විශ්වවිද්‍යාලය, මාතර." යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. ඉල්ලුම්පත්‍රය බහාලන කවරයේ ඉහළ වම් කෙළවරේ පරීක්ෂණයේ නම හා වර්ෂය සඳහන් කළ යුතු ය.

4. පරීක්ෂණය සඳහා පෙනී සිටීමට සුදුසුකම් නොමැති අපේක්ෂකයන් විසින් හෝ අසම්පූර්ණ හෝ ප්‍රමාද වී හෝ එවනු ලබන සියලුම අයදුම්පත් නැවත විමසීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. ප්‍රතික්ෂේප කරනු ලබන අයදුම්පත් වෙනුවෙන් ගෙවා ඇති පරීක්ෂණ ගාස්තු කිසිදු ලෙසකින් ආපසු ගෙවනු නොලබන බව විශේෂයෙන් දන්වමි.

5. මෙම පරීක්ෂණය සඳහා ඔබ මීට පෙර පෙනී සිටියේ නම් අදාළ වර්ෂය, විභාග අංකය හා සමත් අසමත් භාවය පිළිබඳ සටහන් කළ යුතු ය.

6. ඔබ මෙම පරීක්ෂණයන්ට මීට පෙර ඉල්ලුම් කර, පෙනී නො සිටියේ නම් ඊට හේතුව පැහැදිලි ව සටහන් කරන්න. තවද ඔබ විභාගයට පෙනී නොසිටීම සම්බන්ධයෙන් වෛද්‍ය සහතික ඉදිරිපත් කොට එය විශ්වවිද්‍යාලය පිළිගෙන ඇති බැව් ඔබ වෙත දැනුම් දී ඇත්නම් එම තොරතුරු පැහැදිලි ව අයදුම්පත්‍රයේ සඳහන් කරන්න.

7. පරීක්ෂණයට පෙනී සිටින විෂයයන්, පත්‍ර නාමය හා පත්‍ර සංකේතය අයදුම්පතෙහි සටහන් කරන්න.

8. **පරීක්ෂණ ගාස්තු ගෙවීම.**

   පරීක්ෂණ ගාස්තු ගෙවීම සඳහා නියමිත බැංකු වවුචර් පත් දෙකක් විභාග අයදුම්පත සමග එවා ඇත. අදාළ මුදල් එම බැංකු වවුචර් පත් මගින් මහජන බැංකුවේ උයන්වත්ත ශාඛාවේ අංක 032-1-001-1-2477594 දරණ රුහුණ විශ්වවිද්‍යාලයේ බාහිර විභාග ගිණුමට බැරවන සේ දිවයිනේ ඕනෑම මහජන බැංකු ශාඛාවකට ගෙවිය හැක. බැංකුව විසින් ආපසු දෙනු ලබන වවුචර් පත ගාස්තු ගෙවූ කුවිතාන්සිය වශයෙන් අයදුම්පතට අමුණා එවිය යුතු ය. අදාළ පරීක්ෂණ සඳහා ලියාපදිංචි වන හා ලියාපදිංචිය දීර්ඝ කිරීමට අවශ්‍ය සිසුන් ද මතු සඳහන් පරිදි අදාළ මුදල් ගෙවිය යුතු ය. මුදල් ඇණවුම්, තැපැල් ඇණවුම් හෝ චෙක්පත් මගින් කරනු ලබන ගෙවීම් බාර ගනු නොලැබේ.
   අයදුම්පත් සම්පූර්ණ කිරීමේ දී ගෙවන ලද ගාස්තු පිළිබඳ විස්තර අදාළ පරිදි අයදුම්පතේ සඳහන් කළ යුතු ය.

   **නියමිත විභාග ගාස්තු**

   | | |
   |---|---|
   | අසමත් එක් ප්‍රශ්න පත්‍රයක් සඳහා | රු. 1000.00 |

9. ඉල්ලුම් පත්‍රය සමග බැංකු කුවිතාන්සිය හා තමාගේ නම හා ලිපිනය ලියූ රු. 15.00 වටිනා මුද්දර ඇල වූ 9' × 4' (අඟල්) ප්‍රමාණයේ ලිපි කවර 2 ක් අමුණා එවිය යුතු ය. (ලිපි කවර 2හි ඉහල වම් කෙළවරේ ලියාපදිංචි අංකය සඳහන් කළ යුතු ය.)

**සැලකිය යුතුයි** :-ශාස්ත්‍රවේදී සාමාන්‍ය (බාහිර) උපාධි ද්විතීය භාග 2014 පරීක්ෂණයට පෙනී සිටීම සඳහා බාහිර විභාග අතුරු ව්‍යවස්ථාව අනුව ඔබ සුදුසුකම් සපුරන්නේ නම් පමණක් අදාළ අයදුම්පත්‍රය ඉදිරිපත් කළ යුතුය. සාවද්‍ය තොරතුරු සහිත අයදුම්පත්‍ර සඳහා ගාස්තු ආපසු ගෙවීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

සහකාර ලේඛකාධිකාරී,
දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන ඒකකය.